**පාලින්දනුවර ප්‍රාදේශීය සභාව - 2021**

----------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

--------------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දූස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6** **මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1** **පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය තුල ප්‍රමිතයේ 3.27 වගන්තියේ සිට 3.32 වගන්තිය දක්වා වූ පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර නොතිබුණු බව පහත කරුණු අනුව නිරීක්ෂණය විය.<br>• මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ වර්ෂය සඳහා නිවැරදි අතිරික්තය වූ රු.10,959,596 ක් දැක්විය යුතු වුවත්, එය රු.1,296,934 ක් දක්වා තිබීමෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වන මුදල් ප්‍රවාහය රු.9,662,662 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| • කලින් ලද ආදායම්වල වැඩිවීම රු.6,150 මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ජංගම වගකීම්වල වැඩිවීමක් ලෙස දැක්විය යුතු වුවත්, එය මූල්‍ය ක්‍රියාකාරකම්වලින් වූ මුදල් ප්‍රවාහයක් ලෙස දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) ප්‍රමිතයේ 6.10 පරිච්ඡේදය ප්‍රකාරව වත්කමක පිරිවැයෙන් සමුච්චිත ක්ෂය සහ අවශේෂ අගය අඩුකළ පසු ලැබෙන වටිනාකම මත ක්ෂය කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂය සඳහා ක්ෂය ගණනය කිරීමේදී වත්කම්වල අවශේෂ අගයන් ඇස්තමේන්තු කර නොතිබුණු අතර වත්කම්වල පිරිවැය මත පදනම්ව ක්ෂය ගැලපීම් කර තිබුණි | ප්‍රත්‍යාගණන වටිනාකම මත ක්ෂය ගණනය කර ඇති බැවින් අවශේෂ අගය ඇස්තමේන්තු කර නොමැති බව | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**1.6.2 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ)සමාලෝචිත වර්ෂයේ අතිරික්තයේ හෝ ඌනතාවයේ හඳුනාගත් ප්‍රාග්ධන වියදම් ප්‍රදාන රු.9,662,662 ක් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුල අයභාරය යටතේ පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයෙන් ලද ප්‍රදාන ලෙස දැක්වීම වෙනුවට 2021 වර්ෂයේ ප්‍රාග්ධන වියදම් ප්‍රදාන ලැබීම් රු.47,814,639 ක් දැක්වීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය රු.38,151,977 කින් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරි මුල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදිව කටයුතු කරන බව | අතිරික්තයේ හෝ ඌනතාවයේ හඳුනාගත් ප්‍රාග්ධන වියදම් ප්‍රදාන අයභාරය යටතේ දැක්විය යුතුය. |
| (ආ)2021 වර්ෂය සඳහා ප්‍රාග්ධන වියදම් ප්‍රදාන ලැබීම් රු.47,814,639 ක් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුල අනෙකුත් විස්තීර්ණ ආදායම් යටතේ දක්වා නොතිබීමෙන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි | | වර්ෂයේ ලද ප්‍රාග්ධන ප්‍රදාන වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ දැක්විය යුතුය. |
| (ඇ) ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය තුල සමුච්චිත අරමුදල් සඳහා සමාලෝචිත වර්ෂයේ නිවැරදි අතිරික්තය වූ රු.10,959,596 ගැලපීම් වෙනුවට විස්තීර්ණ ආදායම ලෙස රු.1,296,934 ක් දක්වා තිබීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය රු.9,662,662 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2022 වර්ෂය සහා ගිණුම් සකස් කිරීමේදී සමුච්චිත අරමුදල් ගිණුම නිවැරදි කිරීමට කටයුතු කරන බව | සමුච්චිත අරමුදල් ගිණුම තුල වර්ෂයේ අතිරික්තය නිවැරදිව දැක්විය යුතුය. |
| (ඈ) වත්කම් හා වගකීම් ප්‍රකාශය තුල දේපළ, පිරියත හා උපකරණ වල ශුද්ධ පොත් අගය දැක්විය යුතු වුවත්, පිරිවැය රු.377,044,473 ක් ජංගම නොවන වත්කම් යටතේද ක්ෂය වෙන් කිරීම් ගිණුමේ ශේෂය රු.18,277,011 ස්කන්ධය යටතේද දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදිව දැක්වීමට කටයුතු කරන බව | වත්කම් හා වගකීම් ප්‍රකාශය තුල දේපළ, පිරියත හා උපකරණ වල ශුද්ධ පොත් අගය දැක්විය යුතුය. |
| (ඉ) සමාලෝචිත වර්ෂය තුල නව කාර්යාල ගොඩනැගිල්ල හා ශ්‍රවනාගාරය රු.37,176,000 කට තක්සේරු කර තිබුණද එය මුල්‍ය ප්‍රකාශනවල රු.29,459,443 ක් ලෙස රු.7,716,557 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී වෙන් වෙන් වශයෙන් තක්සේරු ලබා ගෙන නිවැරදි කරන බව | තක්සේරු අගයන් නිවැරදිව දැක්විය යුතුය. |

**1.6. 3 අධිකාරී බලය නොලත් ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2014 නොවැම්බර් 12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 25/2014 හි 07 ඡේදය ප්‍රකාරව පළාත් රාජ්‍ය සේවය සඳහා තාවකාලික, අනියම් (දෛනික) , ආදේශක | පිළිතුරු ලබාදී නොමැති බව | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන් |

| | | |
|---|---|---|
| කොන්ත්‍රාත් හෝ සහන පදනම මත සේවකයන් බඳවාගත හැක්කේ කාර්ය මණ්ඩලය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබා ගැනීමෙන් හා අදාල ප්‍රතිපාදන අනුමත කර ගැනීමෙන් පසුව වුවත්, එසේ අනුමත කර ගැනීමකින් තොරව 2019 ජුනි මස සේවකයින් 12 දෙනෙක්ද , 2020 දෙසැම්බර් මස සේවකයින් 21 දෙනෙක් වශයෙන් සේවකයින් 33 ක් බඳවාගෙන පසුව ස්ථිර කර තිබුණි. ඒ සඳහා බඳවාගත් දින සිට 2021 දෙසැම්බර් 31 දිනට සේවකයින් 33 ක් වෙනුවෙන් සභා අරමුදලින් රු.26,287,550 ක් වැටුප් හා දීමනා ගෙවා තිබුණි. | | පසුව බඳවා ගැනීම් කළ යුතුය. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.49,111,572 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,572,270 ක් විය.

**2.2** **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2020 හා 2021 වර්ෂයන්ට අදාලව ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.4,500,000 ක් හා 2019 සිට 2021 දක්වා ලැබිය යුතු මුද්දර ගාස්තු රු.13,460,695 ක් විය. | උසාවි දඩ මේ වන විට සකස් කර පරික්ෂා කිරිම සඳහා යොමු කර ඇති අතර 2021 වර්ෂය සඳහා මුද්දර ගාස්තු උපලේඛන පරික්ෂා කිරිමට යවා ඇති බව | හිඟ මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) බදුරලිය පොළ 2013 වර්ෂයේ බදු දීමේදී බදු කුලිය ලෙස අයවිය යුතු රු.108,599 ක මුදල අය | අයකර ගැනීමට කටයුතු කරන බව | පළාත් පාලන කොමසාරිස්ගේ නියෝග |

| | | |
|---|---|---|
| කිරිමට ක්‍රියා නොකිරීම හේතුවෙන් සභා අරමුදලට සිදු වූ මූල්‍යමය පාඩුව එවකට සභාවේ ලේකම්ගෙන් අයකර ගැනීමට කටයුතු කරන ලෙස බස්නාහිර පළාත් පාලන කොමසාරිස්ගේ 2018 ජනවාරි 03 දිනැති අංක LGN/6/4/1/P29/1 දරන ලිපියෙන් දන්වා තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | | ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කළයුතු වුවත්, රු. 25,290,000 ක් වූ ඉඩම් 36 ක් හා රු.95,764,950 ක් වූ ගොඩනැගිලි 09 ක් ප්‍රත්‍යාගණනය නොකර පිරිවැයට ගිණුම්ගත කර තිබුණි. | මායිම් නිරවුල් කරගෙන නොමැති ඉඩම් හා එම ඉඩම්වල පිහිටි ගොඩනැගිලි තක්සේරු කර නොමැති අතර ඉදිරියේදී තක්සේරු කිරිමට කටයුතු කරන බව | සියළු ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කළයුතුය. |
| (ඇ) භාණ්ඩ සමීක්ෂණ නිර්දේශයකින් තොරව සමාලෝචිත වර්ෂය තුල රු.152,500 ක් වූ වත්කම් ඉවත් කර තිබීම නිසා වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවී තිබුණි. | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරිමේදී නිවැරදි කරන බව | භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ අනුව වත්කම් ඉවත් කළ යුතුය. |

**3.2 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සභාවට අයත් රු.4,000,000 වටිනා අක්කර 19 රූඩ් 01 පර්චස් 20 ක දගමුල්හේන ඉඩම 2021 වත්කම් සමීක්ෂණයේදී භෞතිකව සොයා ගැනීමට නොහැකි වී තිබුණි. | තව දුරටත් පරික්ෂා කර තොරතුරු සොයා ගැනීමට කටයුතු කරන බව | සභාවට අයත් සියළු ඉඩම් හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) මූල්‍ය ප්‍රකාශනවල සඳහන් රු.1,400,000 ක් වටිනා මාරගහදෙනිය වෙළඳපල අයත් ඉඩම , ගම්සභා උසාවිය පිහිටි නාරංඅක්මහහේන ඉඩම හා මැල්ලගහ මුකලාන ගොඩනැගිල්ලට අයත් ඉඩම 2021 වත්කම් සමීක්ෂණ වාර්තාවට අනුව බාහිර පාර්ශව විසින් අත්පත් කර ගෙන තිබුණු බව නිරීක්ෂණය විය. | තව දුරටත් පරික්ෂා කර තොරතුරු සොයා ගැනීමට කටයුතු කරන බව | සභාවට අයත් ඉඩම්වල අයිතිය ආරක්ෂා කර ගැනීමට කටයුතු කළ යුතුය. |